# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 245/3 — 1976 දෙසැම්බර් 27 වැනි සඳුද — 1976.12.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

සීසී/3/2/72.

### සුළු නගර සභා ආඥපනත

### 183 වන වගන්තිය යටතේ ආඥාව

1962 අංක 42 දරණ පනතින් සංශෝධනය කරන ලද (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 183 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති වැලිගම පොල්වත්ත ගලප්පත්තිගේ ආරියදාස වන මම, ඉහත කී වගන්තිය යටතේ තංගල්ල නගරය සම්බන්ධයෙන් පනවනු ලැබ, 1976.11.26 දින අංක 240/14 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාව මෙයින් අවලංගු කරමි.

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස,
පළාත් පාලන ඇමති.

1976 දෙසැම්බර් 23 වැනි දින,
කොළඹ දී ය.

1-47/1

---

සීසී/3/2/92

### නගර සභා ආඥපනත

### 184 වෙනි වගන්තිය යටතේ ආඥාව

1968 අංක 42 දරන පනතින් සංශෝධිත (255 වැනි අධිකාරය වන) නගර සභා ආඥපනතේ 184 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන අමාත්‍ය වැලිගම පොල්වත්ත ගලප්පත්තිගේ ආරියදාස වන මම ඉහත කී වගන්තිය යටතේ තංගල්ල නගරය සම්බන්ධයෙන් පනවනු ලැබ, 1974 මාර්තු මස 12 වැනි දින අංක 102/3 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ආඥාවෙන් අවසාන වරට සංශෝධිත 1972 අගෝස්තු මස 23 වැනි දින අංක 21/4 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාව එහි අවසාන ඡේදය වෙනුවට පහත සඳහන් අළුත් ඡේදය ආදේශ කිරීමෙන් 1976 නොවැම්බර් 18 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් සංශෝධනය කරමි.

(ආ) ඒ නගරය සඳහා එකී ආඥපනත යටතේ අළුත් නගර සභාවක්, සංස්ථාපනය කරගන්නා තුරු, තංගල්ල නගරයේ කටයුතු පාලනය කිරීම පිණිස ද, ඒ කාර්‍ය්‍ය සඳහා එකී ආඥපනත යටතේ නගර සභාවක බලතල ක්‍රියාවෙහි යෙදවීම සහ යුතුකම් ඉටු කිරීම පිණිස විශෙෂ කොමසාරිස්වරයා වශයෙන් වීරකැටිය, මැදමුලන පදිංචි බැසිල් රෝහණ රාජපක්ෂ මහතා පත් කරමි.

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස,
පළාත් පාලන ඇමති.

1976 දෙසැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

1-47/2

1 A—G 24404—1,575 (76/12)

සීසී/3/2/66

## සුළු නගර සභා ආඥාපනත

### 183 වන වගන්තිය යටතේ ආඥාව

1968 අංක 42 දරණ පනතින් සංශෝධනය කරන ලද (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 183 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති වැලිගම පොල්වත්ත ගලප්පත්තිගේ ආරියදාස වන මම, ඉහත කී වගන්තිය යටතේ දෙවිනුවර නගරය සම්බන්ධයෙන් පනවනු ලැබ, 1970 පෙබරවාරි මස 27 දින අංක 14894/6 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවේ අන්තිම ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් එම ආඥාව මෙයින් සංශෝධනය කරමි.

‘(ආ) ඒ නගරය සඳහා එකී ආඥාපනත යටතේ අලුත් සුළු නගර සභාවක් සංස්ථාපනය කැරෙනතුරු දෙවිනුවර නගරයේ කටයුතු පාලනය කිරීම පිණිස ද, ඒ කාර්යය සඳහා එකී ආඥාපනත යටතේ සුළු නගර සභාවක බලතල ක්‍රියාවෙහි යෙදවීම සහ යුතුකම් ඉටු කිරීම පිණිස ද විශෙෂ කොමසාරිස්වරයා වශයෙන් දෙවිනුවර, කන්දපහල පදිංචි අම්බලන්ගොඩගේ දොන් වික්ටර් සිල්වා මහතා පත් කරමි.’

1976 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස,
පළාත් පාලන ඇමති.

1-47/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී